# පුරාණ අනුරාධපුර නාගරීකරණ ක්‍රියාවලිය සම්බන්ධ පුරාවිද්‍යාත්මක විමර්ශනයක්

තුසිත මැන්දිස්[1*] තිස්ස වීරසේකර[2]

[1*]පුරාවිද්‍යා හා උරුමකළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

*thus.mendis@gmail.com

[2]මානවශාස්ත්‍ර අධ්‍යනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

## An archeological investigation on urbanization process of ancient Anuradhapura

T. Mendis, T. Weerasekara

**Abstract:**

It had been assumed that the settlement urbanization process of ancient Anuradhapura was a result of the migration of king Vijaya and his colleagues from India. However, it is almost certain that a settlement cannot have a rapid urbanization process in a short period with the arrival of foreign migrants. Therefore, the urbanization of Anuradhapura could not be a sudden incident. It is essential that a settlement should contain the basic elements to gain the urban status and the social, economical, political and religious factors have to be developed simultaneously to have direct influence on it.

This article studied the early Iron age and protohistoric evidences, through archaeological sources and literature, before the arrival of king Wijaya to reveal the levels of the growth of simple villages and simple urban areas as well as the influence of the regional leadership in the periphery to the urban areas.

**පර්යේෂණ සංක්ෂිප්තය**

මෙම රචනය මගින් සාකච්ඡාවට බඳුන් කර ඇත්තේ අනුරාධපුර නාගරීකරණය ක්‍රියාවලිය කෙසේ ආරම්භ වී වර්ධනය වූයේ දැයි යන්නයි විශේෂයෙන්ම මූලාශ්‍ර වල සඳහන් වන ආකාරයට විජයගේ අමාත්‍යවරයෙකු වන අනුරාධ නැමැත්තා විසින් අනුරාධපුරය ජනාවාස කිරීමෙන් පසුව අනුරාධපුරය නාගරීකරණය වූ බවට සඳහන් වන මූලාශ්‍ර තොරතුරු වඩා නිවැරදි නොවන බව පුරාවිද්‍යා සාධක වලින් පෙනේ විශේෂයෙන්ම පූර්ව ඓතිහාසික සංස්කෘතික අවධියේ දී ආරම්භවන ග්‍රාමීය ජනාවාස ක්‍රමයෙන් අනුරාධපුර හා ජේතවන ප්‍රදේශවල ව්‍යාප්ත වෙමින් ඒ ඔස්සේ ඇති වන දේශපාලන, ආර්ථික, ආගමික හා සමාජීය ක්‍රියාවලිය ඔස්සේ අනුරාධපුරය නාගරීකරණයට පත්වීම පිළිබඳව සාකච්ඡා කොට ඇත.

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ පුරාණ නාගරීකරණ ක්‍රියාවලිය පිළිබඳ ව කළ අධ්‍යයනයන්හිදී ප්‍රධාන වශයෙන් ම නාගරීකරණයට පත් වූ ස්ථාන කිහිපයක් මේ වන විටත් පුරාවිද්‍යාඥයන් විසින් හඳුනා ගෙන තිබේ. ඒ අතුරින් පුරාණ යුගවල දී නාගරීකරණයට පත් වැදගත් ස්ථාන වශයෙන් අනුරාධපුරය, තිස්සමහාරාමය, හා සීගිරිය පෙන්වාදිය හැකි යි. ශ්‍රී ලංකාවේ පුරාණ සමාජය තුළ නාගරික පදනම බිහිවීම සඳහා ප්‍රාග් නාගරික තත්ත්වයන්ගේ සමාජ ක්‍රියාවලිය ඉහළ දායකත්වයන් ලබා දී තිබේ. මෙහි දී නාගරික ක්‍රියාවලිය සඳහා සමාජය තුළින් ඉස්මතු වන පෙළපත් ප්‍රධානීන් හෝ ආගම මුල් කර ගත් නායකයන් තීරණාත්මක කාර්ය භාරයක් ඉටු කරනු ලබයි[1].

නාගරීකරණය (Urbanisam) යන්න මූලාශ්‍රයගත තොරතුරුවලට අනුව උරුමයෙන් ලැබෙන්නා වූ විශිෂ්ට භාවයක් ලෙස හඳුනාගත හැකි යි. නමුත් නාගරීකරණ ක්‍රියාවලිය දෙස පුරාවිද්‍යා දෘෂ්ටියකින් බැලීමේ දී එය ප්‍රාග් නූතන අවධියේ සමාජයේ ක්‍රියාත්මක වූ එකිනෙකට වෙනස් සමාජ තුළ ඇතිවන්නා වූ ප්‍රගමනයන් ඔස්සේ වර්ධනය වන විශේෂ ප්‍රාගුණ්‍යතාවය මගින් ඇතිවන ආර්ථික කළමනාකරණ ක්‍රියාවලියබව පෙනේ[2]. මේ තත්ත්වය කාලය හා අවකාශය මත ගොඩනැගෙන්නා වූ තත්ත්වයක් වන අතර එය ලොව කිසි රටක රේඛීය ලෙස වර්ධනය වනබව නොපෙනේ. විශේෂයෙන් ම ප්‍රාග් නාගරික තත්ත්වයන්ගේ සිට නාගරික තත්ත්වය ඇතිවීම සඳහා සම්භාව්‍ය යුගය තුළ මෙම ක්‍රියාදාමය කැපී පෙනන අතර මිනිසා සහ පරිසරය අතර ගොඩ නැගෙන්නා වූ සුවිශේෂත්වයන් එයට බලපා ඇත.

නාගරික ක්‍රියාවලිය අධ්‍යයනයේදී මිනිස් සමාජය හා පරිසරය එකිනෙකට වෙනත් දේ ලෙස තේරුම් ගනු ලබන්නේ නම් එහි එතරම් තේරුමක් නැත. සම්පත් පරිහරණය, විශේෂයෙන් ම ඛනිජ ද්‍රව්‍ය භාවිතය, සමාජ පසුබිම් හා සම්බන්ධ නොකරන්නේ නම් එහි තේරුමක් හෝ වැදගත්කමක් නොමැත[3]. මෙය වඩාත් සත්‍ය වන්නේ අප කිසියම් සමාජයක හැඩගැසීම්, යුගයේ කෙරෙන සම්පත් පරිහරණය ගැන කතා කරන විටය. බොහෝ විට මෙබඳු සමාජයන්ට සම්පත් වෙත ළඟාවීමට. ඒවා සොයාගැනීමට, ඒවා අත්පත් කර නිෂ්කරණය කර ගැනීමට හා රැගෙන යාම කළයුතු වූයේ කලින් තිබුණු දැනුමක් හෝ යටිතල පහසුකම්වල සහායක් නොමැතිවය[3]. නාගරීකරණයට ප්‍රවිෂ්ට වීමට ප්‍රථම මුල් කාලීන සමාජයන් හා ඒවායේ ප්‍රකෘති ස්වභාවික පරිසරය අතර වූ අන්‍යෝන්‍ය පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය වූ සහජීවන සම්බන්ධතාවය, මාධ්‍යයන් ගණනාවක් තුළින් කලඑළි බස්වන ලදි. එනම් තාක්ෂණ ශිල්පය, යැපුම් රටාව, සම්පත් පරිහරණය හා පදිංචි වීමේ මෝස්තරය තුළිනි[3]. මෙහි ප්‍රතිඵලය වශයෙන් ද්‍රව්‍යමය අන්තර් ක්‍රියාකාරිත්ව ක්‍රියාදාමය වූ මානසික ප්‍රතිචාරය මුදුන් පැමිණෙන්නේ පුළුල් වශයෙන් සමාජමය, ආර්ථික, දේශපාලනමය හා ආගමික යනුවෙන් හැඳින්විය හැකි ආයතන හැඩගැසීමෙනි[1,3]. ඒ අනුව ඉතිහාසයේ කිසියම් නියමිත කාලයක හෝ ස්ථානයක පැවති සමාජ සංස්කෘතික පරිසරය මෙම ජවනිකාව මඟින් ඉහළ තලයකට ඔසවනු ලබන්නේ නාගරික ක්‍රියාවලිය තුළිනි. විශේෂයෙන් ම සමාජ ප්‍රවණතාවල අසමසම සංවර්ධන තත්වයන් මෙහිදී සැලකිල්ලට ගත යුතු යි.

ග්‍රාමීය සරල සමාජයේ සිට සංකීර්ණ නාගරික සමාජයක් කරා වූ ගුණාත්මක වුත් ප්‍රමාණාත්මක වුත් පරිවර්තනයන් මගින් ආයතන හැඩගැසීම, නාගරික අවසානයෙහිදී දීර්ඝ කාලීන ඓතිහාසික උරුමයෙන් ලැබෙන්නා වූ විශිෂ්ට භාවයක් ලෙස නාගරික ක්‍රියාවලිය බිහිවීමට බලපානු ලැබේ.

ප්‍රාග් නාගරික ක්‍රියාවලිය තුළදී හැඩ ගැසෙමින් ඇති සමාජ ඒ හා සම්බන්ධ තාක්ෂණ ශිල්පමය ක්‍රියාදාමවල ගම්‍යතාවය බොහෝ වශයෙන් රඳා පවත්වාගනු ලැබුවේ ප්‍රායෝගික අන්දමින් ඛනිජ සම්පත් හා අනෙකුත් බහුවිධ සම්පත් උපයෝගී කර ගැනීමට මග පෑදූ යම් යම් පූර්ව කොන්දේසි මතය[3]. සුඛෝපභෝගී හෝ අප යෝජ්‍ය හා පුද පූජා සඳහා වෙන් වූ භාණ්ඩයක නිෂ්පාදනය සහ අමුද්‍රව්‍ය ප්‍රයෝජනයට ගැනීම ඉල්ලුමෙන් ඇති වූ වෙනස්කම් අනුව තීරණය විය. මේ වෙනස්කම් සාධක ගණනාවක් මත රඳා පවතී[3]. ඒ සාධක අතර ඇති භාණ්ඩයක කාර්ය බද්ධ වටිනාකම, එම සමාජයේ ද්‍රව්‍යමය මට්ටමේ සංවර්ධනය, - තීරණාත්මක සම්පත් සෘජු ව හෝ වක්‍ර ව ලබා ගැනීමේ හැකියාව, සම්පත් නිෂ්කරණය හා නිෂ්පාදනය සඳහා යෝග්‍ය තාක්ෂණ ක්‍රමයක් තිබීම, අමුද්‍රව්‍ය හා නිමි භාණ්ඩ ප්‍රවාහනයට පහසු කරන හුවමාරු යාන්ත්‍රණයක් හා මාර්ග ජාලයක් තිබීම යන කරුණු නාගරික සමාජයක් දක්වා පරිවර්තනය වීමට මූලික වශයෙන් ඉවහල් වේ[3].

ඉහතින් විස්තර කරන ලද තත්ත්වයන් ඔස්සේ නාගරීකරණය ක්‍රියාවලිය පිළිබඳ ව අධ්‍යයනය කිරීමට ලොව විවිධ රටවල පුරාවිද්‍යාඥයන් පෙළඹෙනු ලබන්නේ 20 වැනි සියවස තුළ දී බව පෙනේ. විශේෂයෙන් ම බොහෝ උගතුන් පෙන්වාදී ඇති කාරණයක් වන්නේ ප්‍රාග් ජනාවාස පද්ධතීන් තුළ ඇති වන්නා වූ ක්‍රියාවලීන් එහි සාමූහික තත්ත්වයන් මත නාගරීකරණයට පත්වන බවය. ලොව නාගරීකරණ ක්‍රියාවලිය බිහි වන්නේ ක්‍රි.පූ. 6000 - 3000 අතර කාලයේදීය[4]. මෙම සමයේදී මිනිසා ලෝහ භාවිතය ඇරඹීම, රෝදය භාවිතය, ජීවිතයට අවශ්‍ය විවිධ උපකරණ නිර්මාණය, ඊජිප්තුවේ, චීනයේ, මෙසොපොතේමියාවේ මෙන් ම සින්දු නිම්නයේ ආරම්භ කිරීම ඔස්සේ එම ස්ථානවල නාගරික ක්‍රියාවලිය ඇරඹෙන බව පෙන්වාදී ඇත. නාගරික ක්‍රියාවලියක් ඕනෑම සමාජයක ඇරඹීම සඳහා ප්‍රධාන වශයෙන් ම කරුණු 10 ක් බලපාන බව චයිල්ඩ්[4] පෙන්වාදී තිබේ.

ඒවා අතර,

i. ජන ඝනත්වයේ ප්‍රසාරණය
ii. මූල ධනය මධ්‍යගත වීම
iii. ස්මාරක හා සෙසු ගොඩනැගිලි බිහිවීම
iv. දුරකතර වෙළඳාම
v. ලේඛනය ඇරඹීම හා අක්ෂර භාවිතය
vi. විද්‍යාවන් බිහිවීම
vii. පන්ති සමාජයක් බිහිවීම
viii. විශේෂ ප්‍රාගුණ්‍යතාවයක් සහිත ශිල්ප ශ්‍රේණි බිහිවීම
ix. රාජ්‍ය පිළිබඳ ආකල්ප ඇතිවීම
x. සෞන්දර්යාත්මක හා කලා රසිකත්වය ඇතිවීම යන කාරණා ප්‍රධාන වී තිබේ.

චයිල්ඩ්ගේ ජනප්‍රිය නාගරීකරණ මතවාදය සඳහා ඉදිරිපත් කරනු ලැබූ නිර්ණායකයන්ට (Criteria) විරුද්ධ මතවාද ද ඉදිරිපත් වී තිබේ[5]. සමහර උගතුන්ගේ මතය වන්නේ නාගරීකරණ ක්‍රියාවලිය මිනිසා හා ස්වභාවික පරිසරය අතර වූ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් බව ය[6]. ඒ අනුව මානවයා විසින් පරිසරය තුළ පවතින්නා වූ භෞතික සම්පත් උපයෝගී කර ගැනීමේ රටාවේ වර්ධනය සමග ප්‍රාග් සමාජ ක්‍රමානුකූල ව දියුණු සමාජ දක්වා වූ ක්‍රියාවලියකට පරිවර්තනය වී ඇත. එහිදී තාක්ෂණ ශිල්පය යැපුම් රටාව, සම්පත් පරිහරණය මෙන්ම ජනාවාස රටාව ද වැදගත් වී තිබේ[3].

මෙම මූලික කාරණා මානවයා විසින් ආරම්භ කිරීම සමග එහි ඊළඟ අදියර තුළ නාගරික ක්‍රියාවලියට අවශ්‍ය දේශපාලන, සමාජ, ආර්ථික, ආගමික යන ආයතන හැඩගැසෙන බව පෙනේ[6,3]. 1960 න් පසු ගෝඩන් චයිල්ඩ්ගේ නාගරීකරණය සම්බන්ධ ක්‍රියාවලිය විවේචනයට බඳුන් වුවද ඔහු ඉදිරිපත් කර ඇති නිර්නායකයන් ඊජිප්තුව, මෙසොපොතේමියාව හා ඉන්දු නිම්නය ආශ්‍රයෙන් වූ නාගරික ක්‍රියාවලිය සඳහා යම් තරමක් දුරට වැදගත් වේ[4]. චයිල්ඩ්ට පසු ව නාගරීකරණ ක්‍රියාවලිය පිළිබඳ ව අධ්‍යයනය කරනු ලැබූ උගතුන් පෙන්වාදී ඇත්තේ එකිනෙකට වෙනස් භූ කලාප තුළ විවිධ සමාජ විසින් ඒ ඒ කාලවල බලපවත්වනු ලැබූ බහුවිධ කාරණා පදනම් කර ගනිමින් කාලය හා අවකාශය තුළ නාගරීකරණයට පත් වී ඇති බවය[3].

## ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සඳහා ශ්‍රී ලංකාවේ අනුරාධපුර ඇතුළුපුරය හා ඉන් පිටත කලාපවල සිදුකරන ලද පුරාවිද්‍යා කැණීම් මඟින් හඳුනාගනු ලැබූ භෞතික සංස්කෘතික තොරතුරු හා මූලාශ්‍රයවල අන්තර්ගත තොරතුරු මෙන් ම දෙස් විදෙස් විද්වතුන් විසින් සිදු කරනු ලැබූ පර්යේෂණවල තොරතුරු උපයෝගී කොටගෙන අධ්‍යයන ක්‍රමවේදය සකස්කොට ගන්නා ලදී.

## විමර්ශනය

ශ්‍රී ලංකාවේ නාගරීකරණය පිළිබඳ සාකච්ඡා කිරීමේදී එයට පූර්වයෙන් දකුණු ආසියානු නාගරීකරණ තත්ත්වයන් විමසා බැලීමද වැදගත් වේ. දකුණු ආසියානු කලාපය ගත් කළ එහි සිදු වූ මුල්ම නාගරික ක්‍රියාවලිය ඉන්දු නිම්නය ආශ්‍රිත ව සිදු වී ඇත [7,8]. ඉන්දු නිම්නය සම්බන්ධව මෙතෙක් සිදු කළ පර්යේෂණවලදී එහි නාගරීකරණ ක්‍රියාවලිය සඳහා ප්‍රාග් හරප්පානු ග්‍රාමීය සංස්කෘතීන් මූලික පදනම සකස් කර ඇති බව හඳුනාගෙන තිබේ[9]. ඉන්දු නිම්නයට වයඹ දෙසින් පිහිටන්නා වූ බලුකිස්ථාන් සානුව තුළ ස්ථානගත ව ඇති ක්වේට්ටා, අම්රි, නාල්, කුල්ලි, ශෝබ් කිලේගුල් මොහොමඩ් යන ප්‍රාග් හරප්පානු ග්‍රාමීය සංස්කෘතීන් තුළ ඇතිවන්නා වූ ක්‍රියාකාරිත්වය ඉන්දු නිම්න නාගරික ශිෂ්ටාචාරය බිහිවීමට පදනම සකසා ඇත [9]. ඇෆ්ගනිස්ථානයේ මුන්ඩික් ගොඩැල්ල තුළ සිදුකරනු ලැබූ කැණීම්වලදී ජනාවාස ස්තර 10ක් හඳුනාගෙන ඇති අතර එහි 6 වන ස්තරයේ කාලනිර්ණය ක්‍රි.පූ. 2625 - 3000 ලෙස ලැබී තිබේ[10]. එසේ ම ක්වෙට්ටා ප්‍රදේශයේ කිලේගුල් මොහොමඩ් (Kilegul Mohomad) ස්ථානයේ නවශිලා යුගයේ සිට සංචාරක එඬේරුන් ජීවත් වූ බව හඳුනාගෙන ඇත. සත්ත්ව ගෘහකරණය හා දෑකැති පාවිච්චි කළ මිනිසුන් ජීවත් වූ බවට සාධක එහි හමුවන අතර ඉන්පසු ක්‍රමානුකූල ව දියුණුවට පත් වූ සංස්කෘතිය තුළ පැසක වේළන ලද මැටි මෙවළම්වල සිට පුළුස්සනු ලැබූ වළං දක්වා පරිවර්තනය හඳුනාගෙන ඇත [10]. මෙයට අමතර ව උතුරු බලුකිස්ථාන් රානාඝුන්ඩායි (Ranagundai) ස්ථානය ආශ්‍රිත ගොඩැල්ල තුළ සිදු කරනු ලැබූ පර්යේෂණ වලින් සෝබ් නිම්න ශිෂ්ටාචාරයට අයත් ලෝහ භාවිතය හා අර්ධ සංචාරක ජන කණ්ඩායම් කලින් කලට එහි පදිංචි වී සිටි බවට සාධක හඳුනාගෙන ඇත [9,10]. එසේ ම මෙම සංස්කෘතික අවධිය තුළින් මොල්ලිය සහිත ගවයා (*Bos indicus*), බැටළුවා

(*Ovis aries*), බූරුවා (*Equus asinus*), අශ්වයා (*Equus caballus*) ආදී ගෘහකරණය කරන ලද සතුන් පිළිබඳ ව සාධක හමුවී තිබේ ඒ අනුව හරප්පා නගර ප්‍රභවයට බොහෝ කලකට පෙර අශ්වයා භාවිතයට ගෙන තිබුණ බවටද සාධක එහිදී හමුවීම අතිශයින් ම වැදගත් ය[9,10]. මෙම ශිෂ්ටාචාර ආශ්‍රිත ව දියුණු වූ මැටි මෙවළම් කර්මාන්තය හා මූර්ති නිර්මාණ පිළිබඳව ද සාධක හමු වේ[9].

අම්රි ශිෂ්ටාචාරය ආශ්‍රිත ව සිදු කරනු ලැබූ පර්යේෂණවලින් ප්‍රාග් හරප්පානු ග්‍රාමීය සංස්කෘතියක් එහි පැවතුණ බව හඳුනාගෙන ඇත. එසේම මුහුදු ආශ්‍රිත බෙල්ලන් විශාල ප්‍රමාණයක් මෙම ස්ථානයේ හමුවන බැවින් ප්‍රාග් හරප්පානු යුගයේදී මෙම ස්ථානය මෝයකට ආසන්න වූ ස්ථානයක් වශයෙන් හඳුනාගෙන තිබේ. අම්රි ශිෂ්ටාචාරය පිළිබඳ ව අදහස් දක්වා ඇති මජුම්දාර් ප්‍රකාශකොට ඇත්තේ අම්රිය හරප්පාවට වඩා නිසැකවම පැරණි ස්ථානයක් වශයෙනි. සමස්තයක් ලෙස අම්රි, නාල්, කුල්ලි,ශෝබ්, කිලේගුල් මොහොමඩ් ආදී ග්‍රාමීය සංස්කෘතීන් ක්‍රමානුකූලව පරිණාමයවී එහි නාගරික අවස්ථාවවූ හරප්පානු නාගරීකරණය සම්බන්ධවී ඇති ආකාරය එහි මැටි බඳුන් හා මූර්ති පිළිබඳ ව අධ්‍යයනයන්ට අනුව පැහැදිලි වේ. මෙම තත්ත්වය නිසා හරප්පා ශිෂ්ටාචාරය මුලදී ඉන්දු නිම්න ශිෂ්ටාචාරය වශයෙන් ද පසුව සින්දු නිම්න ශිෂ්ටාචාරය වශයෙන් විද්වත්හු හැඳින්වූහ. නමුත් මෙම මතයට අභියෝග කළ හෙයින්ස්මොඩ් (Heinezmod) වැනි උගතුන් මෙම ශිෂ්ටාචාරය ඉන්දු නිම්නයට පමණක් නොව ඉන්දියාවේ වයඹ දිග ප්‍රදේශයට ව්‍යාප්ත වන බැවින් එය ආදිතම ඉන්දීය සභ්‍යත්වය වශයෙන් නම්කරන ලදි. පසුකාලීන උගතුන් විසින් මෙම ශිෂ්ටාචාරය මුලින්ම හරප්පාවෙන් සොයා ගත් නිසා හරප්පා සභ්‍යත්වය වශයෙන් නම් කරනු ලැබීය. හරප්පා ශිෂ්ටාචාරය සම්බන්ධ පර්යේෂණ කළ අය අතර ජෝන් මාෂල් ප්‍රමුඛයකු වේ ඔහු විසින් Mohenjodaro and Indus Civilization නම් මාහැඟි කෘතියක් රචනා කොට ඇත [11]. මීට අමතර ව දයාරාම්ෂානි, මජුම්දාර්, විලර් ආදී උගතුන් විසින් ද පර්යේෂණ සිදුකොට එහි නාගකරිකරණ ක්‍රියාවලියේ පදනම පිළිබඳ අදහස් ඉදිරිපත් කොට ඇත. ෆෙයාර්සර්විස් ඉන්දු නිම්නයේ සින්දු ගඟබඩ ආරම්භවූ ශිෂ්ටාචාරය ආගම හා වෙළඳාම ප්‍රමුඛ කොට වෙළඳ මධ්‍යස්ථාන බවට පත් වූ නාගරික ස්ථානයක් බව පෙන්වාදී ඇත[10]. නමුත් ජෝන් මාර්ෂල් පෙන්වාදී ඇති පරිදි සින්දු නිම්න නාගරීකරණය සඳහා තඹ මෙවළම් සමඟ ශිලා මෙවළම් භාවිතය, කුඹල්සක භාවිතය සුළු කර්මාන්ත හා කලා නිර්මාණ, රූපාක්ෂර, රෝද සහිත වාහන භාවිතය සින්දු නිම්නයේ නාගකරිකරණයට බලපා ඇත [11]. එසේ ම මිසරය හා මෙසොපොතේමියාව ආදී ශිෂ්ටාචාර අතර යම් යම් සබඳතා ද එහි නාගරීකරණයට බලපා තිබේ[12]. මේ අකාරයට ක්‍රි.පූ. 2500 තරම් ඈත කාලයකදී හරප්පා නාගරික ශිෂ්ටාචාරය ආරම්භ විය[13]. ක්‍රි.පූ. 1750 දී පමණ එය විනාශ වූ බව කාබන් කාලනිර්ණ මඟින් හඳුනා ගෙන තිබේ[13].

ඉන්දීය අර්ධද්වීපය තුළ සිදුවූ මුල්ම නාගරීකරණ ක්‍රියාවලියට පසු ව එහි දෙවන නාගරීක ක්‍රියාවලිය ගංගා නිම්නය ආශ්‍රිත ව කළ එළි බසිනු දැකගත හැකිය[14,15]. ගංගා නිම්නයේ ඇති වන්නා වූ දෙවැනි නාගරික අවස්ථාවට පදනම දමා තිබෙනුයේ ද හරප්පා ශිෂ්ටාචාරය බිඳවැටීමෙන් ඇති වූ ග්‍රාමීය සංස්කෘතීන් බව පෙනේ. මෙම ග්‍රාමීය සංස්කෘතින්ගෙන් ද තඹ අයුධ භාවිත කළ සංස්කෘතීන් ගංගා නිම්න නාගරීකරණයට මුල්වී ඇති බව එම ප්‍රදේශවලින් සොයා ගත් සාක්ෂි අනුව තහවුරු වේ[16]. ගංගා නිම්නයෙන් හමුවී ඇති සමහර තඹ ආයුධ බටහිර ආසියාතික ආයුධ හා මෙවළම් සමඟ සමානතා ඇති බව පිගොට් ප්‍රකාශ කොට ඇත [9]. නමුත් ගංගා නිම්න තඹ ආයුධ හා බටහිර ආයුධ අතර නිෂ්පාදනය, අමුද්‍රව්‍ය හා තාක්ෂණය අතින් වෙනස්කම් රාශියක් පවතින බව බී.බී.ලාල් පෙන්වාදී තිබේ[16].

මේ පිළිබඳ ව වැඩි දුරටත් අදහස් දක්වන ලාල් විසින් රාජ්පූර් පර්සු (Rajpur Parsu) ස්ථානයේ සිදුකළ කැණීම්වලදී තඹ භාජන සමඟ පඬුවන් පැහැ මැටි බඳුන් (Ochre – Coloured Ware) හමුවන බැවින් මෙම භෞතික සංස්කෘතික තොරතුරු අතර සමානතාවයක් ඇති බව පෙන්වා දෙයි එසේ ම මෙම භාජන කැබලි හස්තිනාපුරයේ කැණීම්වලින් ද සොයා ගෙන ඇත [16]. පඬුවන්පැහැ මෙවලම් සංස්කෘතිය ක්‍රි.පූ. 1200 පෙර පැවතුණ ග්‍රාමීය සංස්කෘතියක් බව ලාල් පෙන්වාදී ඇත[16]. ඔහු වැඩිදුරටත් දක්වා ඇති අදහස් අනුව පඬුවන්පැහැ මැටි මෙවළම් සංස්කෘතිය ට පසු ව ගංගා නිම්නයේ විචිත්‍ර ආශුක්ල (අළුපැහැ බඳුන්) (Painted Gray Ware) මැටි භාජන සංස්කෘතිය ක්‍රියාත්මක ව තිබේ. නොමඳ ව පුළුස්සා ඇති මෙම බඳුන් තුළ රේඛීය රටා හා තිත් රටා දැකගත හැකි ය[16]. හස්තිනාපුරයේ විචිත්‍ර ආශුක්ල මෙවළම් (RLW) භාවිත සංස්කෘතිය ක්‍රි.පූ. 1100 දී ප්‍රභවය වූ බව කාබන් කාලනිර්ණ මඟින් තහවුරු කොට ඇත[16]. මෙම බඳුන් වර්ගයේ ඉහළ කාල පරාසය එසේ වුවද පහළ සීමාව ක්‍රි.පූ. 500-450 අතර කාලයට අයත් බව පිළිගනු ලැබේ[16]. හස්තිනාපුරයේ මෙම මැටි භාජන සංස්කෘතිය ක්‍රි.පූ. 800 දී අවසන් වන බව ලාල් පෙන්වා දෙන අතර ඒ සඳහා ජල ගැලීම් බලපා ඇති බව ප්‍රකාශකොට තිබේ[16]. මින් පසු අහිච්ඡත්‍ර, පනීපත්, ඉන්ද්‍රපත්, තිල්පත, සෝන්පත්, භාගපත් යන ස්ථානවලින් විචිත්‍ර ආශුක්ල මැටි බඳුන් (Painted Gray Ware) හා උත්තර උද්දීප්ත කාල වර්ණ මෙවලම් (Nothern Black Polished Ware) හඳුනාගනු ලැබූ අතර එයින් NBPW මැටි මෙවළම්, PGW මැටි මෙවළම් වලට පසු අවධියකට එනම් ක්‍රි.පූ.300-200 කාලය ට අයත් ලෙස කාල නිර්ණය වී ඇත. හස්තිනාපුරයෙන් ද මෙම භාජන පිළිබඳ ව සාධක හමුවූ බැවින් එමඟින් පැහැදිලි වූයේ PGW සංස්කෘතියට පසු කාලයට NBPW අයත් බවයි[17]. PGW සංස්කෘතිය සමඟ ලැබෙන්නාවූ තවත් වැදගත් සාධකයක් වන්නේ අශ්වයා පිළිබඳ සාධක හමුවීමයි. හස්තිනාපුරයෙන් අශ්ව අස්ථි වාර්තාවී තිබේ විචිත්‍ර ආශුක්ල මැටි මෙවළම් සමඟ යකඩ භාවිතය පිළිබඳ සාධක අත්රන්ජි ඛේරාවෙන් ක්‍රි.පූ. 1025 අයත් ස්තරවලින් [16] උජ්ජෙයින්හි ක්‍රි.පූ. 750-500 අතර ස්තරවලින් යකඩ හා ලෝහ උණු කළ උඳුන් ද සොයාගෙන තිබේ[17]. කෞසම්බියෙන් ද අලගම්ගීර්පුරයෙන් ද හස්තිනාපුරයෙන් ද විචිත්‍ර ආශුක්ල මැටි මෙවළම් භාවිතය හා යකඩ අතර සම්බන්ධයක් ඇති බව ඉන් පැහැදිලිවී තිබේ[16].

මේ අනුව ක්‍රි.පූ. 1100 සිට ක්‍රිපූ 500 දක්වා කාලය තුළ ගංගා නිම්නය ආශ්‍රිත ව තඹ හා යකඩ මෙන් ම OCW (Ocher Coloured Ware), PGW (Painted Gray Ware), NBPW(Northern Black Polish Ware) මැටි මෙවළම් ආශ්‍රිත ප්‍රාග් නාගරික ග්‍රාමීය සංස්කෘතීන් සංවර්ධනයවී දෙවන නාගරීකරණ අවධිය දක්වා සපැමිණ තිබුණ බව පැහැදිලිවී ඇත. එසේ ම මෙම කාලයට සාපේක්ෂව ක්‍රි.පූ. 600-500 වන විට ශ්‍රී ලංකාවේ අනුරාධපුර හා තිස්සමහාරාමය ද නාගරීකරණය වීම ආරම්භ වී තිබුණ බව හඳුනාගෙන ඇත[18,19]. දකුණු ආසියාවේ දෙවන නාගරික අවධිය තුළ හඳුනාගත හැකි සුවිශේෂ ලක්ෂණ වශයෙන් යකඩ තාක්ෂණය, දුර කතර වෙළඳාම, දියුණු සන්නිවේදන ක්‍රම ආදිය භාවිතය පෙන්වාදිය හැකි ය[20]. අනුරාධපුර නගරයේ ආරම්භය පිළිබඳ සඳහන් කරන මහාවංසය එය ග්‍රාමීය මට්ටමේ සිට දියුණු වූ ආකාරය විස්තර කොටඇත. විශේෂයෙන් ක්‍රි.පූ. 5 වන සියවසේ පමණ අනුරාධගාම නමින් හැඳින්වූ ග්‍රාමය ක්‍රි.පූ. 4 වන සියවස පමණ විට අනුරාධපුරය බවට පත් වී ඇත [21]. මහාවංසයේ ලේඛනගත කොට ඇති විස්තරවලට අනුව අනුරාධපුර නගරයක් බවට පත්කරනු ලබන්නේ පණ්ඩුකාභය රජු විසිනි[21]. අනුරාධපුරයේ නාගරීකරණ සැලසුම් කටයුතු ශ්‍රී ලංකා වේ පුරාණ සාම්ප්‍රදායික නගරයක සැලසුම පිළිබඳ ව මනඃකල්පිත

චිත්‍රයක් අප වෙත ලබා දෙයි.

**පුරාණ අනුරාධපුර නාගරීකරණය**

අනුරාධපුර නාගරීකරණ ක්‍රියාවලිය දෙස බැලීමේදී විශේෂයෙන් ම එය ප්‍රොටෝ ඓතිහාසික අනුරාධගාමය ග්‍රාමීය තත්ත්වයන්ගේ සිට ක්‍රමයෙන් හැඩගැසී වර්ධනය වූ බව පුරාවිද්‍යා සාධක අනුව හඳුනාගත හැකි යි. මෙහිදී අප අවධානය යොමු කළයුතු වන්නේ අනුරාධපුර හා තදාශ්‍රිත ප්‍රදේශයේ ප්‍රාග් නාගරික ග්‍රාමීය තත්ත්වයන්හි වර්ධනය කෙරෙහි ය. යාන්ඔය හා කලා ඔය ආශ්‍රිත ව බිහි වන්නා වූ පූර්ව ඓතිහාසික ග්‍රාමීය සංස්කෘතීන්ගේ වර්ධනය විශේෂයෙන් ම අනුරාධපුර නාගරීකරණය සඳහා සෘජු ව බලපා ඇත. පූර්ව ඓතිහාසික සමයේදී එහි සංස්කෘතික කලාපත, භෞමික කලාපයන් අතර සමපාතය ප්‍රධාන වශයෙන් දක්නට ලැබෙනුයේ ක්ෂුද්‍ර-ජීවී පරිසර කලාප සමගය[3]. මෙම යුගයේදී කලා ඔය, යාන් ඔය හා මල්වතු ඔය ආශ්‍රිත ව පිහිටුවා ගනු ලබන ප්‍රාග් නාගරික ජනාවාස එම භෞමික කලාපවල ස්ථාන ගත වන්නේ අදාළ ප්‍රදේශ ආශ්‍රිත ව පවතින්නා වූ සීමිත සම්පත් කරණ කොට ගෙනබව පෙනේ. පූර්ව ඓතිහාසික අවධියේ වාස භූමිවල ජීවී පරිසර පදනම ගැන ප්‍රශ්න කරන විට පැහැදිලි වන්නේ ඒ ඒ භෞමික ක්ෂේත්‍රවල දැකගත හැකි සුවිශේෂ සම්පත්වල පිහිටීමයි. යාන්ඔය මධ්‍ය නිම්නයේ ස්ථානගත ව ඇති කොක්එබේ, ගුරුගල්හින්න, වඩිගවැව, තම්මැන්නා ගොඩැල්ල, දිවුල් වැව, රඹෑව ආදී පූර්ව ඓතිහාසික ස්ථාන පිහිටා ඇත්තේ වියළි කලාපයේ කෘෂි කාර්මික පරිසරයට අයත් වැව් රටේ මධ්‍යයේ නොවන බව පෙනේ[22]. එසේ ම මේ ප්‍රදේශය සලකන කල ප්‍රධාන වශයෙන් ම මැග්නටයිට් යපස් නිධිගත වී ඇති සම්පත් ප්‍රදේශයක් ලෙස හඳුනාගත හැකිය[23]. සේරුනුවර පිහිටන ස්වභාවික ලෝහ පස් මෙම ප්‍රාථමික ග්‍රාමීය සංස්කෘතීන් යථෝක්ත ප්‍රදේශවල ස්ථානගතවීමට බලපා ඇත[24]. එයට අමතර ව කැබිතිගොල්ලෑව ආශ්‍රිත ප්‍රදේශයේ මයිකා නිධිගතවී තිබීමද සැලකිය යුතුය[25]. ඉහළ කලාඔය පද්ධතිය ගත් කල ඒ ආශ්‍රිත ව ජනාවාස පිහිටුවා ගැනීම පහත් කඳුකර ප්‍රදේශ තුළින් හඳුනාගත හැකි ය. මෙම ප්‍රදේශ ආශ්‍රයෙන් ජනාවාස පිහිටුවා ගනු ලබන පූර්ව ඓතිහාසික ජනතාව එහි ස්ථානගතවීමේ දී ඉහළ කඳුකර කලාපයේ ඇති සම්පත්වල උපයෝගීතාවය කෙරෙහි සැලකිල්ලක් දක්වා ඇති බව පෙනේ[3]. භූ විද්‍යා පර්යේෂණ අනුව මාතලේ දිස්ත්‍රික්කයේ සිට ඉහළ කලාඔය තෙක් දකුණේ සිට උතුර බලා දිවෙන උස්භූමි වැටිය තුළ රඹස්, තිරුවානා, ෆෙල්ඩ්ස්ෆාර්, මාබල්, නයිස්, මිනිරන් පිහිටා ඇත [25].

ඛනිජ සම්පත් පිහිටා තිබෙන මෙම ප්‍රදේශය හා ඉහළ කලාඔය නිම්නයේ දඹුල්ල ආශ්‍රිත ප්‍රදේශය නිරන්තරයෙන් ම ජලය ගලන ඇළ දොළවල ජල ප්‍රවාහන රටා නිර්මාණය වූ ප්‍රදේශ විය[3]. අවානක් මෙන් පැතිරෙන කඳුකරය තුළ වන නිම්න ආශ්‍රිත සරු පස පූර්ව ඓතිහාසික සමයේදී එනම් ක්‍රි.පූ. 7-4 සියවස් අතර කාලයේදී ජනයා පදිංචි වී මේ රටාවන් නිර්ණය කරන ප්‍රධාන සාධකයක් විය[3]. දඹුල්ල හා අවට ප්‍රදේශයට මුල් අයස් සමයේ තාක්ෂණ සංස්කෘතික පිරිස් ඇතුළුවීම ඉබ්බන්කටුව, ආනෙකටාව, කන්දලම, රොටවැව, ගලේවෙල ප්‍රදේශ ආශ්‍රයෙන් දැකගත හැකි පූර්ව ඓතිහාසික කුටීර වළලෑම්වලින් තහවුරු වේ[3,26]. මේ ආකාරයට ඉහළ කලාඔය පද්ධතිය, මධ්‍ය යාන්ඔය, මල්වතුඔය ආශ්‍රිත ප්‍රදේශ ඇසුරෙන් දැකගත හැකි පූර්ව ඓතිහාසික ග්‍රාමීය ජනාවාස ක්‍රමානුකූල ව අන්තර් සම්පත් පරිහරණ ක්‍රියාවලිය ඔස්සේ හුවමාරුව ඇරඹීම සමඟ අනුරාධපුර ප්‍රධාන ආර්ථික මධ්‍යස්ථානය ලෙස ඉස්මතු වීම සිදු වේ. මෙහිදී බහු සම්පත් යැපුම් රටාව ක්‍රියාත්මක වීම සමඟම අර්ථ - ස්ථාවර ජන කණ්ඩායම් මඟින් පර්යන්ත ප්‍රදේශවලින් ලබා දෙනු ලැබූ පදනම අනුරාධපුරය නගරයක් ලෙස ඉස්මතු වන්නට බලපෑ බව උපකල්පනය කළ හැකි ය. විශේෂයෙන් ම කේන්ද්‍රීය ලෙස අනුරාධපුරය වර්ධනය වීමේදී පර්යන්ත ප්‍රදේශවල සිදු වූ සම්පත් අත්පත් කරගැනීම, නිෂ්කරණය ඒවා නෙළා ගැනීම හා නිෂ්පාදන ක්‍රියාවලිය ඔස්සේ භාණ්ඩ හුවමාරුව සිදු වෙමින් ඒවා බෙදාහැරීම කිරීමේදී තීරණාත්මක ලෙස අනුරාධපුරය වැදගත්වී තිබේ. අනුරාධපුරය ප්‍රධාන බෙදා හැරීම මධ්‍යස්ථානය බවට පූර්ව ඓතිහාසික අවධියේ පත්ව තිබූ බව සේරු නුවර මුල්කොට ගත් තඹ සම්පත් පරිහරණය ක්‍රියාවලිය තුළින් හා ඉන්දියාවේ සිට මෙරටට ආනයනය කරන ලද කානීලියන් පබළු බෙදා හැරීමේ ක්‍රියාවලිය තුළින් පැහැදිලි වී තිබේ[27].

AG 69 3 A ස්තරයෙන් හමුවන (5b) වර්ගයේ කානීලියන් පබළු හා පබළු නිෂ්පාදන කාර්මිකශේෂ සොයා ගැනීමෙන් තහවුරු වන්නේ අනුරාධපුරයේ නිෂ්පාදනය කරනු ලැබූ කානීලියන් පබළු ඉබ්බන්කටුව දක්වා පරිවහනය වී ඇති බව ය[3,27]. එසේ ම මධ්‍ය කඳුකරයේ සම්භවය ලබන ඇමතෙස්ත, තිරුවාණා, ආදී පාෂාණ හා ඒවායින් නිර්මාණය කරන ලද පබළු වර්ගද ඇතුළුපුරයේ පූර්ව ඓතිහාසික ජනාවාස ස්තරවලින් හමුවී තිබීමෙන් පැහැදිලි වන්නේ ඉතා සුවිශේෂී ලෙස භාණ්ඩ හුවමාරු ක්‍රියාවලිය අනුරාධපුරය කේන්ද්‍රගත කොට සිදුවී ඇති බවය[27]. අනුරාධපුර හා පර්යන්ත ප්‍රදේශ අතර සිදු වන්නා වූ මෙම අන්තර් භාණ්ඩ හුවමාරු ක්‍රියාවලිය පදනම් පූර්ව ඓතිහාසික අවධිය මැද භාගයේදී එනම් ක්‍රි.පූ. 600-500 කාලයේදී අනුරාධපුරය නගරයක් දක්වා සංවර්ධනයට මඟ පාදා ඇති බව දැරණියගල පෙන්වාදී ඇත [18]. දැරණියගලගේ විග්‍රහයන්ට අනුව මෙම කාලය තුළ ඇතුළුපුර ජනාවාසය හෙක්ටයාර 50ක වපසරියකින් යුක්තවී තිබේ[18]. මෙම සමය වනවිට බහු සම්පත් යැපුම් රටාව, ජන ඓර්බනයේ ප්‍රසාරණය හා අක්ෂර භාවිතය ඇතුළුපුරය තුළින් හඳුනාගෙන තිබේ[28,29].

ඇතුළුපුර ජනාවාසය ක්‍රමානුකූල ලෙස නගරයක් දක්වා වර්ධනය වීමේදී එහි හමුවී ඇති මැටි භාණ්ඩවල වෙනස්කම්ද මනා සාක්ෂි සපයන බව විද්වතුන්ගේ මතයවී තිබේ. විශේෂයෙන් ම, AG 69 3A ස්තරය අයත් කාල පරිච්ඡේදයේදී කාලරක්ත වර්ණ මැටි මෙවළම් (BRW), සරල රතුදුඹුරු භාණ්ඩ සමඟ හමුවී තිබේ[18]. ඒවා ක්‍රි.පූ දහවැනි, නවවැනි ශතවර්ෂයට අයත් බව සලකනු ලැබේ. අළු පැහැති බඳුන් මෙම ජනාවාස ස්තරවල හමු නොවන අතර කාලවර්ණ මැටි මෙවළම් හමුවේ. ක්‍රි.පූ. 700-500 අතර ASW 1 සංසිද්ධි අංක 89 හා AMP සංසිද්ධි අංක 75 මගින් මධ්‍යම ප්‍රමාණයේ මැටි මිශ්‍රණ සහිත ආනයනය කරන ලද බඳුන් හමුවී තිබේ[30]. මෙම බඳුන් පශ්චාත් කාලයට අයත් රූලේටඩ් මැටි භාණ්ඩවලට සමානයැයි උපකල්පනය කර ඇත. AG 69 13 A(1) ශෛලීයේ කැපී පෙනන මැටි භාණ්ඩ හස්තිනාපුර් NBPW මට්ටම්වල 44 වන ශෛලියට සහසම්බන්ධතාවයක් පෙන්වන බව දැරණියගල ප්‍රකාශකොට ඇත [27]. එමගින් මෙම කාලපරාසය තුළ උතුරු ඉන්දීය සහ සම්බන්ධතාවය හා (එම) අන්තර් දේශීය සම්බන්ධතා පැහැදිලි වන බව AG 69 3 A (ii) මැටි භාණ්ඩ මගින් තහවුරු වේ. මේ අනුව ක්‍රි.පූ. 700-500 දක්වා අනුරාධපුර සංස්කෘතියේ ප්‍රධාන වෙනස්වීමක් මෙමඟින් පෙනෙන අතර උත්තර උද්දීප්ත කාලවර්ණ මෙවළම් (NBPW) ක්‍රි.පූ. 4 වන ශත වර්ෂයට අයත් බව AG 85 සංසිද්ධි අංක 15 තුළින් පැහැදිලි වේ. මෙම මැටි භාජන වර්ගය නිෂ්පාදනය උත්තර ඉන්දියාවේ ගංගා මිටියාවතේ සිදුවී ඇත [18]. මෙවැනි භෞතික සංස්කෘතික තොරතුරු තුළින් ක්‍රි.පූ. 4 වන ශත වර්ෂයේ සිට ගංගා මිටියාවතේ නාගරික මධ්‍යස්ථාන සමඟ ශ්‍රී ලංකාව සහසම්බන්ධතා පවත්වා ඇතිබව පැහැදිලි වේ.

ක්‍රි.පූ. 4 වන ශත වර්ෂයේ අශෝක අධිරාජ්‍යයට පෙර උතුරු ඉන්දියාවේ බුද්ධිමය සම්ප්‍රදායන්වල ව්‍යාප්තිය හඳුනාගැනීමට NBPW මැටි භාණ්ඩ සහ දීප්තියෙන් අඩු අළු පැහැති මැටි භාණ්ඩ උපයෝගී වනබව පෙන්වාදෙන දැරණියගල එමගින් ඉන්දියානු ශ්‍රී ලංකා සහ සබඳතාවයන් පැවති කාලයට පසු කාලයේදී මධ්‍යධරණී පිඟන් භාණ්ඩවල හා රූලේටඩ් පිඟන් භාණ්ඩ වානිජ පරමාර්ථ පෙරදැරිව දකුණු බෙංගාල නිෂ්පාදන මධ්‍යස්ථානයේ සිට ශ්‍රී ලංකාවට ආනයනය කොට ඇති බව පෙන්වා දී ඇත[31]. NBPW මැටි මෙවළම් ක්‍රි.පූ. 4 වන සියවසේ සිට මුල් ක්‍රිස්තු යුගය දක්වා පරිහරණයවී ඇත (සුදර්ශන් සෙනෙවිරත්න සමඟ සිදුකළ සම්මුඛ සාකච්ඡාවක් ඇසුරිනී) එසේ ම රූලේටඩ් වර්ගයේ බඳුන් ක්‍රි.පූ. 2 වන සියවසේ සිට ක්‍රිව ්දෙවැනි සියවසට අයත් සන්දර්භවලින් වර්තාවී තිබෙන අතර[31] එමගින් අනුරාධපුර නගරය බටහිර රටවල් සමඟ සම්බන්ධතා පැවැත්වූ බව මෙම පිඟන් භාණ්ඩ මඟින් හඳුනාගත හැකිය. ක්‍රි.ව. 2 වැනි ශත වර්ෂයට අයත් ASW 1 සංසිද්ධි අංක 49 හමුවූ පිඟන් භාණ්ඩ බටහිර ආසියානු සම්බන්ධතාවය මැනවින් කියාපාන සාධකයක් බව දැරණියගල හා කනිංහැම් ප්‍රකාශ කොට ඇත [18,29]. අනුරාධපුර නාගරීකරණ ක්‍රියාවලිය අධ්‍යයනයේදී ශිල්ප නිෂ්පාදන කටයුතු පිළිබඳ ව ලැබෙන සාධක ද බෙහෙවින් ම වැදගත් වේ. එම කටයුතු අතර ක්‍රි.පූ. 500ට පෙර යුගයන්හිදී නිර්මිත පබළු වර්ග ඇතුළුපුරයෙන් හමුවී ඇති විනිවිද පෙනෙන රතු වීදුරු පබළු AG 85, 8a(iv) සහ 8b(i) යන වර්ග යටතේ හඳුනාගෙන ඇත [27]. එසේම AG 69 Type 10b (i) සහ 8b (i) ලෙස වර්ගකොට දක්වා ඇත්තේ ක්‍රි.පූ. 6 වැනි ශත වර්ෂයේ සිට ක්‍රි.පූ. 3 වැනි ශත වර්ෂය දක්වා කාලය අතර පරිහරණය වූ පබළු බව දැරණියගල විසින් පෙන්වාදී තිබේ[31]. මේ අනුව අනුරාධපුර නාගරීකරණ ක්‍රියාවලිය යනු දේශීය හා විදේශීය වශයෙන් ඇතිවී තිබූ විවිධ සමාජ ආර්ථික තත්ත්වයන් මත පැනනැගුණු සිද්ධි දාමයක් බව මෙම භෞතික සංස්කෘතික තොරතුරු අනුව හඳුනාගත හැකි ය.

අනුරාධපුර නාගරීකරණ ක්‍රියාවලියේ වඩා වර්ධනාත්මක අවස්ථාව අපට හඳුනා ගත හැක්කේ ක්‍රි.පූ 3 වන සියවසින් පසුව බව පෙණේ. සාහිත්‍ය මූලාශ්‍රයාගත තොරතුරු අනුව මෙම කාලවකවානුව මහින්දාගමනය මගින් බෞද්ධාගම මුල්බැස ගන්නා කාලයට අයත් වේ[33]. මෙම කාලපරිච්ඡේදය තුළදී අනුරාධපුර පර්යන්ත ප්‍රදේශ ආශ්‍රිතව පැවති ප්‍රදේශගත බහුවිධ සම්පත් ප්‍රයෝජනයට ගැනීම පෙරටවඩා සැලසුම්ගත ව සිදුකොට තිබෙනබව හඳුනාගත හැකි යි. බහු සම්පත් පරිහණය නිසා කෙන්ද්‍රිය ලෙස අනුරාධපුරය නාගරීකරණයේ උච්චිචතම අවස්ථාවට පැමිණෙන අතර මේ සමය වනවිට ක්ෂුද්‍ර හා සාර්ව ප්‍රදේශවල පරිසරය ගැන වඩා හොඳ අවබෝධයක් තිබූ බව පෙනේ.

මුල් ඓතිහාසික අවධිය (Early Historic) තුළින් හඳුනාගතහැකි ක්‍රියාදාමය ලෙස සම්පත් කෙලින්ම ලබා ගැනීම, නිෂ්පාදනය, බෙදා හැරීම් කටයුතු ඇරඹීම බව පෙන්වාදිය හැකියි. මේ සඳහා මාර්ග පද්ධතිය පුළුල් වීමද බලපාන්නට ඇතැයි උපකල්පනය කළ හැකියි. එසේ ම මෙම අවධියේදී බිහිවන්නා වූ විශේෂ ප්‍රාගුණ්‍යතාව සහිත ශිල්ප කණ්ඩායම්හි ඉස්මතු වීම අනුරාධපුර නාගරීකරණයට දායකත්වය ලැබෙන තීරණාත්මක කරුණක් වේ.එහිදී පරුමක, ගහපති, බත, බරත, අශ හෝ අස ආදී විශේෂණ පද තමන් හැඳින්වීම සඳහා යොදාගත් පුද්ගලයන් උතුරු මැද හා තදාශ්‍රිත ප්‍රදේශයේ පැලපදියම් වී කර්මාන්ත ශිල්පීන් හා නිෂ්පාදන බෙදාහරින්නන් ලෙස ක්‍රියා කොට ඇති ආකාරය මුල් බ්‍රාහ්මී අභිලේඛන අනුව හඳුනාගත හැකි ය. ස්වභාවික සම්පත්වල පිහිටීම හා පාලන ඒකකවල ආරම්භය සමඟ පුරාතන රාජ්‍යය හැඩගැසීම පිළිබඳ සහසම්බන්ධතාවය ඉන් ගොඩනැගෙන බව පර්යේෂකයන් විසින් පෙන්වාදී තිබේ[34]. විශේෂයෙන් ශ්‍රී ලංකාවේ ස්වභාවික සම්පත් වන මුතු, මැණික්, යකඩ, තඹ හා අනෙකුත් භූගත සම්පත්වල පිහිටීමත් මුල් ඓතිහාසික යුගයේ ජනාවාසවල ස්ථානගතවීමත් අතර යම් සම්බන්ධතාවයක් තිබේ[35]. මෙම ස්වභාවික සම්පත් මුල් ඓතිහාසික යුගයේදී අනුරාධපුර ට කෙළින්ම හා වක්‍ර ආකාරයට ලැබුණ බව අනුරාධපුර වටා පිහිටි ස්ථාන අනුව පැහැදිලි වේ.

අනුරාධපුරයට නැගෙනහිර පර්යන්ත ප්‍රදේශය තුළ සිදුවූ ලෝහ සම්පත් පරිහරණය මෙන්ම අනුරාධපුරය දකුණින් ඉහළ කලාඔය හා මධ්‍ය කලාඔය නිම්නය ආශ්‍රිතව මුල් ඓතිහාසික යුගයේ ජීවත් වූ ප්‍රජාව කඳුකර දුර්ග තුළින් එක් පරිසර පද්ධතියක සිට තවත් පරිසර පද්ධතියකට භාණ්ඩ හා සම්පත් ප්‍රවාහනය සඳහා ප්‍රවේශ වීමේ මාර්ග යොදාගත් බව පර්යේෂණ වලින් තහවුරු කරගෙන ඇත.

විශේෂයෙන්ම මුල් බ්‍රාහ්මී අභිලේඛනවල සඳහන් වන්නාවූ කඩ යන වචනය මඟින් භූ රූපණ හෝ සම්පත් කලාප සමඟ සම්බන්ධ වන නිශ්චිත භූමි ප්‍රදේශය ක්ෂුද්‍ර තත්ත්වයකදී කඩ යන්නෙන් ව්‍යවහාර කර ඇත්තේ කන්දක් හෝ කඳු කපොල්ලක් යන ගම්‍ය අර්ථයෙන්[3]. මුල් ඓතිහාසික යුගය වනවිට එබඳු ස්ථාන සම්පත් එකතු කිරීමේ හෝ භාර ගන්නා මධ්‍යස්ථාන වශයෙන් ක්‍රියා කළ ජනපද බවට පරිණාමය වන්නට ඇත. මාතලේ සිට දඹුල්ල දක්වා වූ මුල් ඓතිහාසික යුගයේ එවැනි කඩ ජනපද ගැන සඳහන් වී ඇත [3]. එක් පරිසර පද්ධතියක සිට තවත් පරිසර පද්ධතියකට භාණ්ඩ සැපයීම මඟින් කඳුකර ප්‍රදේශ තුළට ජනපද කලාප ව්‍යාප්තවීම පමණක් එමඟින් අදහස් නොවේ. එයට අමතරව ආර්ථික වැඩ කටයුතු මඟින් මුල් ඓතිහාසික අවධියේ අළුත් තාක්ෂණික මූලිකාංග හා සමාජ සැකසුම්, අළුත්භූමි හා පරිසර කලාපවලට ඇතුළු කරනු ලැබීය[3]. මෙම පරිසර කලාපවලට ඇතුළුවූ ප්‍රජාව මූලික වශයෙන්ම ස්වභාවික ඛනිජ සම්පත් සමඟ සම්බන්ධවීම කැපීපෙනේ[3]. දේවානම්පියතිස්ස හා දුට්ඨගාමිණී රජු දවස තලාතු මිනිරන්, රිදී, මැණික් ගල් හා රත්තරං සපයා දුන් ගිරිකන්ඩ පිළිබඳව වංසකථාවල සඳහන්වේ[32]. විශේෂයෙන්ම වංසකතාකරුවන් එහිදී අනුරාධපුරයට නැගෙනහිර හා දකුණු ප්‍රදේශයේ තිබෙන සම්පත් පිළිබඳව සාකච්ඡා කරඇති ආකාරය එයින් හඳුනාගත හැකියි.

වගු අංක 1. අනුරාධපුරයට ආසන්න හා පර්යන්ත ප්‍රදේශවල ස්වභාවික ඛනිජ සම්පත්වල පිහිටීම දැක්වෙන වගුව [25, 23, 24]

| ස්ථානය | පළාත | භෞතික සම්පත් |
|---|---|---|
| පෙරියපුලියන්කුලම, ඔච්චප්පුකල්ලුමුතුගල, නුවරගමකන්ද | උතුරුමැද | මුතු, යකඩ, රත්තරං, මයිකා |
| නුවරකන්ද, රනගිරමඩ, තිත්තවෙල | වයඹ | යකඩ, මයිකා |
| ගෝනවත්ත, බඹරගල | මධ්‍යම | යකඩ, මැණික් |
| බෝවත්තේගල, මොට්ටයාක්කල්ලු, කල්වුඩුපොතාන, කුසලාන්කන්ද, සේරුවිල | නැගෙනහිර | යකඩ, තඹ |

මුල් ඓතිහාසික අවධියේදී පර්යන්ත ප්‍රදේශ තුළ පෙළපත් ප්‍රධානීන් සම්පත් පිහිටි ප්‍රදේශ මෙන් ම ඒවා ප්‍රවාහනය කෙරෙනු මාර්ගවලද පාලන බලය සතු කර සිටි බව පෙනේ. නාලන්ද අසල දෙමැද ඔයෙන් සොයා ගනු ලැබූ මුල් බ්‍රාහ්මී අභිලේඛනයක මවුඩික නැමති රජු පිළිබඳ සඳහන් වේ[35]. ඔහුගේ නිලධාරීන් මැණික් සම්පත් ආශ්‍රිත ක්‍රියාවලියට දායක වූ බව පෙනේ[3]. මෙහිදී මොහු ප්‍රයෝජනයට ගනු ලැබුවේ මැණික් ගල් ද, ස්ඵටික හුණු ගල් ද තලාතු මිනිරන් ද කියා පැහැදිලි ව කිව නොහැක[32]. මේ ආකාරයට ප්‍රාදේශීය පාලන ප්‍රදේශවල සිට ගම් (ගාම) පිහිටුවා ගත් මොවුන් නගර හා නිෂ්පාදන බෙදා හැරීම් මධ්‍යස්ථාන වලට මහා පරිමාණ ආකාරයෙන් සම්පත් ලබාදෙන්නට ඇත. එම නිසා ම මුල් ඓතිහාසික අවධිය තුළ උතුරුමැද පළාත තුළ මෙම සම්පත් හැසිරවූ පරුමක, ගහපති, බත, බරත, අශ/අය යනාදී විශේෂණ පද භාවිතා කළ පුද්ගලයන්ගේ පුළුල් ස්ථානගත වීමක් හඳුනාගත හැකිය.

වගු අංක 2. මුල් ඓතිහාසික අවධියේ උතුරුමැද පළාත තුළ ජීවත් වූ විවිධ පදවි දැරුවන් පිහිටුවා ඇති ශිලා ලිපි ප්‍රමාණය දැක්වෙන වගුව[35]

| | |
|---|---|
| පරුමක | 91 |
| ගමික | 14 |
| බත | 39 |
| ගහපති | 23 |
| බරත | 13 |
| අස/අය | 08 |

මෙම පුද්ගලයින් පිළිබඳ ව සාකච්ඡා කිරීමේදී මොවුන් විශේෂ වාණිජ කටයුතුවල යෙදුනාවූත්, දේශීය සමාජ කණ්ඩායම් නායකයන් බඳු විශේෂඥයින් නිෂ්පාදන ශිල්පීන්, තොටුපලවල් පාලකයින් බව පෙනේ. කෘෂිකාර්මික කටයුතු හසුරවන්නන් හා විවිධ ශිල්ප නිෂ්පාදන කටයුතු හැසිරවීම සම්බන්ධ ක්‍රියාකරන්නන් ලෙස ද ඔවුන් කටයුතු කර ඇති බව පැහැදිලි වේ[3].

මෙම තත්ත්වයන්ට අනුව අනුරාධපුර නාගරීකරණ ක්‍රියාවලියේදී මුල් ඓතිහාසික අවධියේ ජන කණ්ඩායම් නායකයන් විවිධ ශිල්පීය කාර්යයන් සඳහා දායකත්වය උතුරුමැද කලාපය ආශ්‍රයෙන් ලබාදී ඇති අතර ඔවුන්ගේ සමාජ සැකස්ම එකිනෙකට බද්ධ වූ පරිසර කලාපවල ජීවත් වූ අනෙක් ජන කණ්ඩායම් නායකයන් සමග සම්බන්ධ ව තිබූ බව මැනවින් පැහැදිලි වේ. මේ අනුව අනුරාධපුර නාගරීකරණ ක්‍රියාවලිය ප්‍රාග් අනුරාධපුර ග්‍රාමීය තත්ත්වයන්ගේ සිට ක්‍රමානුකූල ව ආරම්භවී පර්යන්ත ප්‍රදේශ ආශ්‍රිත ව ඇති වූ සම්පත් පරිහරණය හා විදේශීය ගනුදෙනු ක්‍රියාවලිය සමග වර්ධනයට පත් වූ බව භෞතික සංස්කෘතික තොරතුරු හා සාහිත්‍ය මූගාශ්‍රයන් මෙන් ම අභිලේඛන සාධක අනුව පෙන්වාදිය හැකි යි.

**ආශ්‍රිත කෘති**


1.Whearley P. The Concept of Urbanism. In: Ucko PJ, Tringnam R. (Eds). The man Settlement and Urbanism. London: Duckworth, 1972.

2. Renfrew C. Trance formation. In: Transformation: Mathematical Approaches to Cultural Change. New York: Academic Press, 1979.

3. සෙනෙවිරත්න එස්. පර්යන්ත ප්‍රදේශය හා ආන්තික ප්‍රජාවෝ, ශ්‍රී ලංකාවේ මුල් අයස් සමයේ ද්‍රව්‍ය හා සමාජ සැදුම් පිළිබඳ විකල්ප තේරුම් කිරීමක් කරා, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පුරාවිද්‍යා අධ්‍යයන අංශය, 1996.

4. Child VG. The Urban Revolution. *Town Planing Revew* 1950; 21: 3-17.

5. Clark DL. Towns in the Developments of Early Civilizations. In: Analytical Archaeologist Collected papers of David Clarke edited by Colleages. New York : Acadamic Press. 1979.

6. Butzer KW. Archaeology as Human Ecology. Cambridge: Cambridge University Press, 1990.

7. Agrawal DP. The Archaeology of India, New Delhi: Selectbook Service Syndicate, 1984.

8. Posshel G. Scientific dates for South Asian Archaeology, University of Pennsylvania, Asian Section, University Museum, Occassional Publications 1, 1990.

9. Piggott S. Pre historic India. London: Pelican,1961.

10. Fairservis WA. Excavations in the Quetta Valley, West Pakistan. *Anthropological Papers of the American Museum of Natural History* 1956; 45: 382-83.

11. Marshall SJ (Ed.). Mohenjo-Daro and the Indus Civilization. London: Arthur Probsthain, 1931.

12. Dikshit MG. Beads from Ahichchatra U.P, in: Ancient India 8, 1952.

13. Ghosh A. Indian Archaeology 1963-64: A Review. India: Archaeological Survey of India, 1964.

14. Coningham RAE. The rise of cities in Sri Lanka. in the Archaeology of Early historic South Asia, Allchin,F.R.ed. Cambridge: Cambridge University Press. 1955.

15. Allchin B. The end of the harappan Urbanism and It's Legancy.in Archaeology of Early Historic South Asia: The Emergence of cities and states Allchin, F.R & R.A.E Conningham, eds. Cambridge: Cambridge University press, 1995.

16. Lal BB. Excavation at Hastinapura and other explorations in the upper Ganga and Sutlej basins 1950-2 : New light on the Harappa Culture and the early historical period. *Ancient India* 1991;10: 5-151.

17. Banarjee NR. The Iron Age in India, New Delhi: Munshiram Manoharalal, 1965.